# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2440/22 - 2025 ජුනි මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2025.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 10 (3) වගන්තිය යටතේ නිකුත් කෙරෙන නිවේදනය

**බලපත්‍රයකින් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීම**

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (2) වගන්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කරමින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, පහත සඳහන් තැනැත්තන් ගණයන්ට විදුලිය උත්පාදනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමේ සහතිකයක් මෙයින් නිකුත් කරනු ලැබේ.

| *සහතික අංකය* | *නිදහස් කළ පාර්ශවය* | *බලපැවැත්වෙන කාලය* |
|---|---|---|
| EL/EX/G/25-01 | පහත සඳහන් තාක්ෂණික වින්‍යාසයන්ගෙන් එකක් සහිත වහල මත සූර්ය ෆොටෝ වෝල්ටීය (RTSPV) පද්ධතිය භාවිතයෙන් විදුලිය නිපදවන පුද්ගලයින් කාණ්ඩය :<br><br>අ. එක් මනුවක් සහ එක් ගිණුමක්<br>ආ. මනු දෙකක් සහ එක් ගිණුමක්<br>ඇ. මනු දෙකක් සහ ගිණුම් දෙකක් | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවලංගු කරන තෙක් සහ/හෝ සංශෝධනය කරන තෙක් |

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉහත සඳහන් නිදහස් කිරීම සිදු කරනු ඇත.

1. **අර්ථ විග්‍රහ සහ අර්ථ කථනය**

- *අර්ථ විග්‍රහ*

මෙම කොන්දේසිවල, අන්‍යාකාරයකින් සඳහන් කර නැත්නම් හෝ අන්‍යාර්ථයක් අවශ්‍යවේ නම් මිස :

| | |
|---|---|
| "පනත" | යන්නෙන් අදහස් වන්නේ, (2013 අංක 31 දරන පනත මගින් සංශෝධනය කරන ලද) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත වේ. |
| "කොමිෂන් සභාව" | යන්නෙන් අදහස් වන්නේ කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වේ. |
| "බෙදාහැරීමේ බලපත්‍රලාභියා" | යන්නෙන් අදහස් වන්නේ පනතේ 13(1)(c)(i)(c) වගන්තිය යටතේ විදුලිය බෙදා හැරීම උදෙසා නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා වේ. |
| "විදුලි පරීක්ෂක" | යන්නෙන් අදහස් වන්නේ 2014 අංක 01 දරන විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්යයන්, රාජකාරි සහ ක්‍රියා පටිපාටි) රෙගුලාසි යටතේ දක්වා ඇති ක්‍රියා පටිපාටිවලට අනුකූලව පනතේ 6 වන වගන්තියට අනුව එහි සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පත් කරන ලද පුද්ගලයෙකු වේ. |
| "පාරිසරික නීති" | යන්නෙන් අදහස් වන්නේ මිනිස් සෞඛ්‍යය, ශාක, සත්ත්ව විශේෂ සහ ඒවා රඳා පවතින පරිසර පද්ධති ඇතුළුව පරිසර ආරක්ෂා කිරීමේ අරමුණින් වරින් වර බලාත්මක වන නීති වන අතර එම නීති වලට 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සහ වාතය, භූමිය සහ ජලය ආරක්ෂා කිරීම සම්බන්ධ සියලුම අදාළ නීති ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවේ. |
| "නිදහස් කළ තැනැත්තා" | යන්නෙන් අදහස් වන්නේ පනතේ 10(1) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි විදුලිබල උත්පාදනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තෙකු හෝ තැනැත්තන් ගණයක් වේ. |
| "උත්පාදන පහසුකම" | යන්නෙන් අදහස් වන්නේ බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ බෙදාහැරීමේ ජාලයට බෙදා හැරීමේ අරමුණින් විදුලිය උත්පාදනය කිරීම සඳහා උපයෝගී කරගන්නා හෝ ඒ සම්බන්ධව භාවිතා කරන අන්තර් සම්බන්ධතාවය, ආරක්ෂිත සහ පාලන උපකරණ ඇතුළුව ඕනෑම විදුලි උත්පාදන බලාගාරයක්, ආම්පන්න, අඩුවැඩියා හෝ උපකරණ වේ. |
| "තොරතුරු" | යන්නෙන් අදහස් වන්නේ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ඕනෑම ආකෘතියකින් හෝ මාධ්‍යයකින් (කොමිසමේ ඉල්ලීම පරිදි හෝ වෙනත් ආකාරයකින් විශේයෙන් සකස් කරන ලද) ඕනෑම පොත්, ලේඛන, වාර්තා, ගිණුම්, ඇස්තමේන්තු, ප්‍රතිලාභ, වාර්තා හෝ වෙනත් දත්ත වේ. |
| "දැන්වීම" | යන්නෙන් අදහස් වන්නේ පනතේ 10 (2) වගන්තිය යටතේ නිකුත් කරන ලද මෙම ගැසට් නිවේදනයයි. |
| "කොමිෂන් සභා පනත" | යන්නෙන් අදහස් කරන්නේ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතයි |
| "උත්පාදන ස්ථානය" | යන්නෙන් අදහස් වන්නේ නිදහස් කළ තැනැත්තා විසින් උත්පාදන පහසුකම ක්‍රියාත්මක කර නඩත්තු කරනු ලබන පරිශ්‍රය අදහස් වේ. |

| | |
|---|---|
| "සම්මත අයක්‍රම ගිවිසුම" | යන්නෙන් අදහස් වන්නේ පනත 25(4) වගන්තිය සහ සැපයුම් සේවා සංග්‍රහය ප්‍රකාරව අයක්‍රම පාරිභෝගිකයා සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියා අතර පරිශ්‍රයට විදුලිය සැපයීම සඳහා ඇති කර ගන්නා ලද සම්මත ගිවිසුම වේ. |
| "අයක්‍රම පාරිභෝගිකයා" | යන්නෙන් අදහස් වන්නේ පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුගෙන් විදුලිය සැපයුමක් ඉල්ලා සිටින සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිය සපයනු ලබන පුද්ගලයෙකු වේ. |

- <u>අර්ථ කථනය</u>

<u>මෙම ලේඛනයේ අරමුණු සඳහා පහත සඳහන් නියමයන්ට පහත අර්ථයන් පවරා ඇත</u>

- **මනුව (එක් මනුවක් සහ එක් ගිණුමක් සඳහා වන අවස්ථාවෙහි) :**

උත්පාදන ස්ථානයට ආනයනය කරන ලද සහ/හෝ අපනයනය කරන ලද ශුද්ධ විදුලි ශක්තිය වාර්තා කිරීමේ අරමුණින් බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් සපයනු ලබන සහ ස්ථාපනය කරන ලද විදුලි මනුව.

- **මනු (මනු දෙකක් සහ එක් ගිණුමක් සහ මනු දෙකක් සහ ගිණුම් දෙකක් වන අවස්ථා වලදී)**

බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් සපයනු ලබන සහ ස්ථාපනය කරන ලද පහත සඳහන් විදුලි මනු ගැන සඳහන් වේ.

අ) උත්පාදන පහසුකම මගින් ආනයනය කරන ලද මුළු විදුලි ශක්තිය වාර්තා කිරීම සඳහා මනුවක් ; සහ

ආ) උත්පාදන පහසුකම මගින් අපනයනය කරන ලද මුළු විදුලි ඒකක වාර්තා කිරීම සඳහා මනුවක්

- **ගිණුම (එක් මනුවක් සහ එක් ගිණුමක් සහ මනු දෙකක් සහ එක් ගිණුමක් අවස්ථා වලදී) :**

බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් සම්මත අයක්‍රම ගිවිසුමේ නියමයන්ට අනුකූලව නිර්මාණය කර අයක්‍රම පාරිභෝගිකයා වෙත පවරා ඇති විදුලි ගිණුම වේ.

- **ගිණුම් (මනු දෙකක් සහ ගිණුම් දෙකක් වන අවස්ථා වලදී) :**

පහත සඳහන් දෑ වෙත යොමු වේ :

අ) සම්මත අයක්‍රම ගිවිසුම යටතේ බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් නිර්මාණය කරන ලද සහ අයක්‍රම පාරිභෝගිකයා වෙත පවරා ඇති විදුලි ගිණුම ; සහ

ආ) උත්පාදන පහසුකම මගින් අපනයනය කරන ලද විදුලි ශක්තිය වාර්තා කිරීම සඳහා, බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විශේෂයෙන් නිර්මාණය කර අයක්‍රම පාරිභෝගිකයා වෙත නිරූපිත වශයෙන් පවරා ඇති ගිණුමක්.

**2. නියාමන උපකරණ සමග අනුකූල වීම**

නිදහස් කළ තැනැත්තා, උත්පාදන පහසුකම් ස්ථාපනය, මෙහෙයුම් හා නඩත්තු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පනතට හා එහි සංශෝධන වලට අනුකූලව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සියලුම ආරක්ෂිත, තාක්ෂණික සහ මෙහෙයුම් සංග්‍රහ, රීති, ප්‍රමිති, මාර්ගෝපදේශ සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

**3. කොමිෂන් සභාවේ තීරණ, නියෝග, උපදෙස් සහ නීර්ණ**

(i) උත්පාදන පහසුකම් ස්ථාපනය, මෙහෙයුම් හා නඩත්තු කිරීමේදී කොමිෂන් සභාව විසින් ගනු ලබන සියලුම තීරණ, නියෝග, උපදෙස් සහ නීර්ණ වලට අනුකූලව නිදහස් කළ තැනැත්තා කටයුතු කළ යුතුය.

(ii) එවැනි අනුකූලතාවයන් සඳහා සිදුකරන පිරිවැය නිදහස් කළ තැනැත්තා විසින් දරාගත යුතුය.

**4. කොමිෂන් සභාවට තොරතුරු සැපයීම**

පනත හෝ කොමිෂන් සභා පනත මගින් පවරන ලද හෝ පැවරී ඇති කාර්යයන් සඳහා අවශ්‍ය වන හෝ කොමිෂන් සභාව විසින් අවශ්‍ය විය හැකි යැයි සලකනු ලබන තොරතුරු ලබා දීමට නිදහස් කළ තැනැත්තා කටයුතු කළ යුතුය.

**5. ප්‍රවේශය**

(i) කොමිෂන් සභාවේ පූර්ණ දැනුම්දීමකට යටත්ව විදුලි පරීක්ෂකවරුන් ඇතුළු කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට උත්පාදන ස්ථානයට ඇතුළු වීම සඳහා නිදහස් කළ තැනැත්තා විසින් අවසර ලබා දිය යුතුය. එම නිලධාරීන්ට උත්පාදන පහසුකම මෙන්ම ඕනෑම උපකරණ, යටිතල පහසුකම්, මෘදුකාංග යෙදුම් හෝ අදාළ වාර්තා පරීක්ෂා කිරීමට සහ අදාළ සියලුම ලියකියවිලි සමාලෝචනය කිරීමට අයිතියක් ඇත.

(ii) නිදහස් කළ තැනැත්තා එම උත්පාදන ස්ථානයෙහි පදිංචිකරු හෝ හිමිකරු නොවන්නේ නම්, එම නිලධාරීන්ට උත්පාදන ස්ථානයට ඇතුළු වීමට නිදහස් කළ තැනැත්තා එහි පදිංචිකරුගෙන් හෝ හිමිකරුගෙන් අවසර ලබා ගත යුතුය. කෙසේ වෙතත්, හදිසි අවස්ථාවකදී එම පෙර දැනුම් දීමේ අවශ්‍යතාවය අත්හැර දැමිය හැකිය.

**6. ජාල සම්බන්ධතාවය සහ ක්‍රියාත්මක කිරීම**

(i) නිදහස් කළ තැනැත්තා, බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ බෙදා හැරීමේ ජාලයට උත්පාදන පහසුකම් සම්බන්ධ කර ගැනීමට බෙදාහැරීමේ බලපත්‍රලාභියා සමග ගිවිසුමකට එළඹිය යුතුය.

(ii) ජාලයට, බෙදාහැරීමට බලපත්‍රලාභියාගේ කාර්ය මණ්ඩලයට සහ සාමාන්‍ය ජනතාවට විය හැකි ආරක්ෂිත අවදානම් වැළැක්වීම සඳහා උත්පාදන පහසුකමට anti-islanding ආරක්ෂාව සහ අනෙකුත් ආරක්ෂණ ඇතුළත් කළ යුතුය.

**7. පරිසරය**

නිදහස් කළ තැනැත්තා යම් පාරිසරික නීතියකින් නිදහස් කිරීමක් හෝ සහන කාලයක් ලබා දීමක් හැරුණුකොට ශ්‍රී ලංකාවේ අදාළ වන සියලුම පාරිසරික නීතිවලට අනුකූල විය යුතුය.

**8. ආරක්ෂාව**

පුද්ගල ජීවිත, උත්පාදන පහසුකම හා දේපළ සහ උපකරණ, තුවාල, හානි සහ උවදුරු වලින් ආරක්ෂා කිරීමට සාධාරණ සහ අවශ්‍ය සියලු පියවර නිදහස් කළ තැනැත්තා විසින් ගත යුතුය. එමෙන්ම උත්පාදන පහසුකම් ඉවත් කිරීමේදීද සියලු ආරක්ෂිත පියවර අනුගමනය කළ යුතුය.

**9. රක්ෂණය**

නිදහස් කළ තැනැත්තා උත්පාදන පහසුකම හා සම්බන්ධ අවදානම් කළමනාකරණය සහ රක්ෂණය සම්බන්ධයෙන් සාධාරණ සහ විචක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කර ක්‍රියාත්මක කළ යුතුය.

**10. නිදහස් කිරීමේ සහතිකය වෙනස්කම් කිරීම**

මෙම දැන්වීමේ ඕනෑම කොන්දේසියක් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට කොමිෂන් සභාවට අයිතිය ඇත.

**11. වරද**

මෙහි දක්වා ඇති ඕනෑම කොන්දේසියකට අනුකූල වීමට අපොහොසත් වන හෝ උල්ලංඝණය කරන ඕනෑම නිදහස් කළ තැනැත්තෙකු පනත යටතේ වරදක් කර ඇති බව සලකනු ලැබේ.

**12. අවලංගු කිරීම් සහ ඉතිරිකිරීම්**

පනතේ 10 (3) වගන්තිය යටතේ 2017 පෙබරවාරි 14 දිනැති අංක 2006/19 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2018 මාර්තු 9 දිනැති අංක 1961/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නිදහස් කිරීම් සහතික මින් අවලංගු කර ඇති අතර දැනට ක්‍රියාත්මක වන සියලුම යෝජනා ක්‍රම සඳහා එම සහතික අදාළ වීම අවසන් වනු ඇත. දැනට ක්‍රියාත්මක වන එවැනි යෝජනා ක්‍රම සියල්ලම මෙහි දක්වා ඇති තාක්ෂණික වින්‍යාසයන්ට අනුරූප වන පරිදි මෙම නිදහස් කිරීමේ සහතිකය යටතට ඇතුලත් වේ.

EOG 06 - 0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.